ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2020/02/24 |

## ජා.පා.මි.ද. මත පදනම් වූ උද්ධමනය 2020 ජනවාරි මාසයේ දී ඉහළ යන ලදී

**මතුපිට උද්ධමනය**
- ලක්ෂ්‍යමය උද්ධමනය : 7.6%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.1%
- මාසික වෙනස : 1.5%

**මූලික උද්ධමනය**
- ලක්ෂ්‍යමය උද්ධමනය : 3.9%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 5.6%
- මාසික වෙනස : 0.8%

**ජා.පා.මි.ද. වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනසෙහි විචලනය**




**ජා.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2019 දෙසැම්බර් මාසයේ පැවති සියයට 6.2හි සිට 2020 ජනවාරි මාසයේ දී සියයට 7.6 දක්වා ඉහළ යන ලදී. ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමයන්හි මිලගණන්වල සිදු වූ මාසික ඉහළ යෑම් මේ සඳහා දායක විය. ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය 2019 දෙසැම්බර් මාසයේ දී පැවති සියයට 8.6හි සිට 2020 ජනවාරි මාසයේ දී, 2017 නොවැම්බර් මාසයෙන් පසු වාර්තා වූ ඉහළම අගය වන, සියයට 13.7 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. තවද, ආහාර නොවන කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය 2020 ජනවාරි මාසයේ දී සියයට 3.0ක් ලෙස වාර්තා විය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි දර්ශකයෙහි වෙනස, 2019 දෙසැම්බර් මාසයේ පැවති සියයට 3.5හි සිට 2020 ජනවාරි මාසයේ දී සියයට 4.1 දක්වා ඉහළ ගියේය.

[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

ජා.පා.මි දර්ශකයෙහි මාසික වෙනස සියයට 1.5ක් ලෙස වාර්තා වූ අතර, ඒ සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩවල අයිතමයන්හි මිල ගණන්වල දක්නට ලැබුණු ඉහළ යෑම් හේතු විය. 2019 වසරේ අග භාගයේ දී පැවති අයහපත් කාලගුණික තත්ත්වයේ බලපෑමෙන් ඇති වූ සැපයුම් හිඟයන් ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන් ඉහළ යෑමට හේතු විය. ආහාර කාණ්ඩයෙහි එළවළු, පොල්, රතු ළූණු සහ මාළු මිල ගණන්වල ඉහළ යෑම් වාර්තා විය. මීට අමතරව, ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි ද ඉහළ යෑමක් වාර්තා වූ අතර, ඒ සඳහා නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ වෙනත් ඉන්ධන (නිවාස කුලී); අධ්‍යාපන (අමතර පන්ති ගාස්තු); සහ මද්‍යසාර පාන වර්ග සහ දුම්කොළ යන උපකාණ්ඩයන්හි අයිතමවල මිල ගණන් ඉහළ යෑම හේතු විය.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2019 දෙසැම්බර් මාසයේ දී පැවති සියයට 5.2හි සිට 2020 ජනවාරි මාසයේ දී, 2019 ජනවාරි මාසයෙන් පසු වාර්තා වූ පහළම අගය වාර්තා කරමින්, සියයට 3.9 දක්වා පහළ ගියේය. කෙසේ වුවද, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2020 ජනවාරි මාසයේ දී සියයට 5.6ක් ලෙස වාර්තා විය.

## දත්ත ඇමුණුම

### සංඛ්‍යා සටහන 01 : ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2018 | ජනවාරි | 125.8 | 123.9 | -0.6 | 0.1 | 5.4 | 2.1 | 7.6 | 4.5 |
| | පෙබරවාරි | 123.7 | 124.4 | -1.7 | 0.4 | 3.2 | 2.0 | 7.2 | 4.1 |
| | මාර්තු | 122.8 | 124.6 | -0.7 | 0.2 | 2.8 | 1.9 | 6.7 | 3.6 |
| | අප්‍රේල් | 122.9 | 124.8 | 0.1 | 0.2 | 1.6 | 1.9 | 6.1 | 3.3 |
| | මැයි | 124.3 | 125.1 | 1.1 | 0.2 | 2.1 | 1.7 | 5.7 | 3.1 |
| | ජූනි | 126.5 | 125.3 | 1.8 | 0.2 | 2.5 | 1.8 | 5.3 | 2.9 |
| | ජූලි | 126.6 | 125.7 | 0.1 | 0.3 | 3.4 | 2.3 | 5.1 | 2.7 |
| | අගෝස්තු | 125.4 | 126.3 | -0.9 | 0.5 | 2.5 | 2.7 | 4.7 | 2.5 |
| | සැප්තැම්බර් | 124.4 | 126.9 | -0.8 | 0.5 | 0.9 | 3.1 | 4.0 | 2.4 |
| | ඔක්තෝබර් | 124.9 | 127.3 | 0.4 | 0.3 | 0.1 | 3.4 | 3.3 | 2.4 |
| | නොවැම්බර් | 127.7 | 127.6 | 2.2 | 0.2 | 1.0 | 3.1 | 2.7 | 2.4 |
| | දෙසැම්බර් | 127.1 | 127.6 | -0.5 | 0.0 | 0.4 | 3.1 | 2.1 | 2.4 |
| 2019 | ජනවාරි | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 | 1.8 | 2.7 |
| | පෙබරවාරි | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 | 1.7 | 3.0 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 | 1.7 | 3.3 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 | 1.9 | 3.7 |
| | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 | 2.0 | 4.0 |
| | ජූනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 | 2.0 | 4.4 |
| | ජූලි | 129.4 | 133.4 | 0.2 | 0.3 | 2.2 | 6.1 | 1.9 | 4.7 |
| | අගෝස්තු | 129.7 | 133.7 | 0.2 | 0.2 | 3.4 | 5.9 | 2.0 | 5.0 |
| | සැප්තැම්බර් | 130.6 | 134.0 | 0.7 | 0.2 | 5.0 | 5.6 | 2.3 | 5.2 |
| | ඔක්තෝබර් | 131.9 | 134.4 | 1.0 | 0.3 | 5.6 | 5.6 | 2.8 | 5.4 |
| | නොවැම්බර් | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 | 3.0 | 5.6 |
| | දෙසැම්බර් | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 | 3.5 | 5.7 |
| 2020 | ජනවාරි | 137.0 | 135.3 | 1.5 | 0.8 | 7.6 | 3.9 | 4.1 | 5.6 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව